**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්ව විද්‍යාලය**

# ඇබෑර්තු

## අධ්‍යයන, අධ්‍යයන සහායක කාර්ය මණ්ඩලය
## ඉංජිනේරු පීඨය

### යාන්ත්‍රික ඉංජිනේරු දෙපාර්තමේන්තුව

**01. මහාචාර්ය /ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර**

විෂය ක්ෂේත්‍ර : මෙකාට්‍රොනික් හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව

**02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය (ස්ථිර නොකල), කථිකාචාර්ය (පරිවාස) තනතුරු**

විෂය ක්ෂේත්‍ර : බලශක්ති, මෝටර්රථ යාන්ත්‍රික, කර්මාන්ත ඉංජිනේරු, යන්ත්‍ර සහ ශක්තිය, ඉංජිනේරු ඇඳීම, පරිගණක ආශ්‍රිත නිර්මාණ සහ නිෂ්පාදනය, ඝනතාවය පිළිබඳ විද්‍යාව, ස්වයංකරණය, දත්ත ආකෘති, මෙකාට්‍රොනික් හා පරිගණක ආශ්‍රිත සජීවීකරණය, රොබෝ තාක්ෂණය

**03. උපදේශක තනතුර - II ශ්‍රේණිය**

විෂය ක්ෂේත්‍ර : මෙකාට්‍රොනික් හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව

### ගගන ඉංජිනේරු දෙපාර්තමේන්තුව

**01. මහාචාර්ය /ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර**

විෂය ක්ෂේත්‍රය : ගගන ඉංජිනේරු විද්‍යාව

**02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය (ස්ථිර නොකල), කථිකාචාර්ය (පරිවාස) තනතුරු**

විෂය ක්ෂේත්‍ර : ගුවන්යානා විද්‍යුත් හා මෙවලම්, ප්‍රචාලනය, ගුවන්රාමු පද්ධති, ගුවන්යානා සැකිලි, ගුවන් සේවා තත්ත්ව කළමනාකරණ පද්ධති, පරිගණක තරල ගතිකතාව, හානිකර නොවන පරීක්ෂණ

### සිවිල් ඉංජිනේරු දෙපාර්තමේන්තුව

**01. මහාචාර්ය /ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර**

විෂය ක්ෂේත්‍රය : සිවිල් ඉංජිනේරු විද්‍යාව

**02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය (ස්ථිර නොකල), කථිකාචාර්ය (පරිවාස) තනතුරු**

විෂය ක්ෂේත්‍ර : භූ තාක්ෂණික ඉංජිනේරු සහ නිර්මාණය, ව්‍යුහාත්මක ඉංජිනේරු සහ නිර්මාණය, ඉදිකිරීම් ඉංජිනේරු සහ කළමනාකරණය, පාරිසරික ඉංජිනේරු සහ නිර්මාණය, ජල ඉංජිනේරු සහ නිර්මාණය, අධිවේගී හා ප්‍රවාහන ඉංජිනේරු, මැනුම්

### ගණිත දෙපාර්තමේන්තුව

**01. මහාචාර්ය /ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර**

විෂය ක්ෂේත්‍රය : ඉංජිනේරුමය ගණිතය

**02. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය (ස්ථිර නොකල), කථිකාචාර්ය (පරිවාස) තනතුරු**

විෂය ක්ෂේත්‍ර : සංඛ්‍යානය, ඉංජිනේරුමය ගණිතය, ආකෘති නිර්මාණය සහ සමාකරණය

**03. උපදේශක තනතුර - II ශ්‍රේණිය**

විෂය ක්ෂේත්‍ර : සංඛ්‍යානය, ඉංජිනේරුමය ගණිතය, ආකෘති නිර්මාණය සහ සමාකරණය

### විදුලි, විද්‍යුත් හා සන්නිවේදන අධ්‍යයන දෙපාර්තමේන්තුව

**01. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය - I ශ්‍රේණිය/ II ශ්‍රේණිය, කථිකාචාර්ය (ස්ථිර නොකල), කථිකාචාර්ය (පරිවාස) තනතුරු**

විෂය ක්ෂේත්‍ර : විදුලි යන්ත්‍ර හා ධාවක, විදුලි පද්ධති, බල ඉලෙක්ට්‍රොනික විද්‍යාව, පාලක පද්ධති, කර්මාන්ත ස්වයංක්‍රියකරණය හා රොබෝ තාක්ෂණය, ද්‍රව්‍යයන්ගේ විද්‍යුත් ගුණාංග, අධි වෝල්ටීයතා ඉංජිනේරු විද්‍යාව, විදුලි පද්ධති නිර්මාණය හා ස්ථාපනය, සුහුරු ජාල හා ක්ෂුද්‍ර ජාල, බල ශක්ති ප්‍රභේද අධ්‍යයනය, ඇන්ටෙනා සහ ප්‍රචාරණය, රූප සැකසීම සහ යාන්ත්‍රික දැක්ම, ඉංජිනේරු නිෂ්පාදන නිර්මාණය, ඩිජිටල් පද්ධති නිර්මාණය හා විශාල පරිමාණ අනුකලන පරිපථ නිර්මාණය, දෘෂ්‍ය සන්නිවේදන පද්ධති, පැලදුම් ඉලෙක්ට්‍රොනික විද්‍යුත් චුම්භක තරංග, ක්ෂුද්‍ර පාලක සහ කාවැද්දුම් පද්ධති, විද්‍යුත් චුම්භක තරංග, ක්ෂුද්‍ර තරංග ඉංජිනේරු විද්‍යාව, විදුලි සංදේශ ජාල නිර්මාණ ශිල්පය, වෛද්‍ය විද්‍යා අනුරූපන සහ ජීව වෛද්‍ය රූප සැකසුම් ඉංජිනේරු විද්‍යාව, වෛද්‍ය විද්‍යා උපකරණ සහ ජීව සංවේදක ඉංජිනේරු විද්‍යාව, ජීව ද්‍රව්‍ය ඉංජිනේරු විද්‍යාව

### වැටුප් පරිමාණ

| | | | |
|---|---|---|---|
| 01. | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය තනතුර | :- | U-AC 5 (I) රු. 139,175-11x2,925-171,350 p.m |
| 02. | මහාචාර්ය තනතුර | : - | U-AC 5 (II) රු. 117,350 - 13x2,700 – 152,450 p.m. |
| 03. | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය I ශ්‍රේණිය තනතුර | :- | U-AC 3 (I) රු. 91,310 - 7x2,170 – 106,500 p.m. |
| 04. | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය II ශ්‍රේණිය තනතුර | :- | U-AC 3 (II) රු. 79,360 - 11x1,630 – 97,290 p.m. |
| 05. | කථිකාචාර්ය (ස්ථිර නොකළ) තනතුර | :- | U-AC 3 (III) රු. 69,580 - 5x1,630 – 77,730 p.m. |
| 06. | කථිකාචාර්ය (පරිවාස) තනතුර | :- | U-AC 3 (IV) රු. 54,600 - 10x1,335 - 67,950 p.m. |
| 07. | උපදේශක II ශ්‍රේණිය තනතුර | :- | U-AS 1 (I) රු. 48,385 - 19x690 - 61,495 p.m. |

### වෙනත් ප්‍රතිලාභ

සුදුසුකම්ලත් තනතුරු සඳහා සප්ත වාර්ෂික නිවාඩු සහ පර්යේෂණ දීමනාව, නොමිලේ සෞඛ්‍ය රක්ෂණාවරණයක්, වාර්ෂික දිරි දීමනා, සේවකයින්ගේ දරුවන් සඳහා ශිෂ්‍යත්ව, විශ්වවිද්‍යාලයීය රෝහලෙහි ප්‍රතිකාර ලබා ගැනීමේ දී ප්‍රමුඛතාවය සහ වෙනත් වරප්‍රසාද

### පොදු කොන්දේසි

1. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
2. අයදුම්කරුවන් තෝරාගැනීම, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පරිපාටියට අනුකූලව සහ සම්මුඛ පරීක්ෂණ ප්‍රතිඵල පදනම් කරගෙන සිදුකරනු ඇත.
3. අයදුම්කරුවන් තෝරා ගැනීම, ඒ ඒ තනතුරෙහි / ශ්‍රේණියෙහි අනුමත ඇබෑර්තු ගණන සම්පූර්ණ වනතෙක් පමණක් ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලයේ කළමනාකරණ මණ්ඩලය විසින් සිදුකරනු ඇත.
4. අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ඇත.
5. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණවලට කැඳවීමට පෙර ඔවුන් කෙටි ලැයිස්තුගත කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලයට ඇත.
6. කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියෙන් (www.kdu.ac.lk) භාගත කරගත හැකි ආකෘතිය මගින් පමණක් අදාල තනතුර සඳහා ඉල්ලුම් කරන ලෙස අයදුම්කරුවන්ට තරයේ දන්වා සිටිනු ලැබේ. ප්‍රමාදවී ලැබෙන, අසම්පූර්ණ හෝ නියමිත ආකෘතියට පරිබාහිරව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
7. අයදුම්කරුවන් විසින් වෙබ් අඩවියෙන් භාගත කරගෙන තමා විසින් සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය අදාළ සහතිකපත්හි ඡායා පිටපත් සහිතව **2021 පෙබරවාරි මස 01** වෙනි දිනට හෝ එදිනට පෙර ලේඛකාධිකාරී, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, රත්මලාන යන ලිපිනයට එවිය යුතු ය.
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද ආසන්නතම වැටුප් චක්‍රලේඛය අනුව වැටුප ගෙවනු ලබන අතර වැටුපට අමතරව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද වෙනත් දීමනා ගෙවනු ලැබේ.
9. ඉල්ලුම්කරුවන්, සිය ඉගැන්වීමේ හැකියාව ඔප්පුකර පෙන්වනු පිණිස තේරීම් කමිටුව ඉදිරියේ ඉදිරිපත් කිරීමක් (ඉංග්‍රීසි භාෂාවෙන්) කළ යුතුය.
10. ලියුම් කවරයේ ඉහළ වම්පස කෙලවරේ අයදුම්කරනු ලබන තනතුර ලිවිය යුතුය.
11. සුදුසුකම් සඳහා විශ්වවිද්‍යාල වෙබ් අඩවිය හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 05/2015, 916, 04/2010, 721, 08/2016, 08/2016 (ii), 07/2018 සහ ඒවායේ විශේෂ සටහන් සහ අදාළ සංශෝධන වෙත යොමු වෙන ලෙස අපේක්ෂකයින්ට උපදෙස් දෙනු ලැබේ.
12. තෝරාගන්නා ලද අපේක්ෂකයින්ට මෙම විශ්වවිද්‍යාලයේ ඕනෑම පරිශ්‍රයක සේවය කිරීමට හා රාජකාරී කිරීමට හැකියාව තිබිය යුතුය.
13. විශ්වවිද්‍යාල/ ආයතන/ රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් අදාළ ආයතන ප්‍රධානියා හරහා තම අයදුම්පත් යොමු කළ යුතුය.

වැඩිදුර විස්තර සඳහා පිවිසෙන්න :-
**www.kdu.ac.lk.**

**අවසාන දිනය**
**2021. 02. 01**

**අයදුම්පත් එවිය යුතු ලිපිනය :**
ලේඛකාධිකාරී
ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය
රත්මලාන